( 25 )

# අඹගමුව ශිලා ලේඛනය පිළිබඳව වන පුරා විද්‍යාත්මක අධ්‍යයනය

එච්.ටී.සී.ඩී. හපුතන්ත්‍රී
තෙ වැනි වසර

## හැඳින්වීම.

ශිලා ලේඛනය ගත්කල මෙය ඉතා දිගු අතීතයක් වෙත ගමන් කරන්නා වූ එක් ක්‍රමවේදයකි. ලක්දිව ශිලා ලේඛන අතර ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, පර්වත ලිපි මේ යනාදී රාශියක් හඳුනා ගත හැකි ය. මෙහි දී නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ කෙළවරක පිහිටන අඹගමුව යන ස්ථානයත් එම ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් ස්ථාපිත වූ මෙකී අඹගමුව සෙල්ලිපියත් එහි වන පුරා විද්‍යාත්මක වටිනාකමත් යන කරුණු සබැඳිව කරුණු අධ්‍යයනය වැදගත් කරුණක් සේ හඳුනා ගත හැකි ය. මෙබඳු වටිනා ස්ථාන හා ලියවිලි වල හරය ඵලදායීත්වය අවශ්‍යයතාව දැඩි වනුයේ අදටත් වඩා මතුවට ය. එහෙයින් මේවායේ ඉතිහාසය ඓතිහාසික වතගොත සේම පුරා විද්‍යාත්මක වශයෙන් ඔප් නැංවිය යුතු අගයන් කවරේදැයි විමසා බැලීම වැදගත් වේ. මීට අමතරව ශ්‍රී පාදස්ථානය වෙනුවෙන් සිදු කළ උතුම් මෙහෙය අගයනු වස් මෙම සෙල්ලිපිය පිහිටුවීම වැදගත් වේ.

## ස්ථානගත වීම

මධ්‍යම පළාතට අයත් නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය වශයෙන් උතුරින් මහනුවරත් නැගෙනහිරින් බදුල්ල දකුණින් රත්නපුර හා බස්නාහිරින් කෑගල්ල යන දිස්ත්‍රික්ක වලට මායිම් ව පිහිටා ඇති අතර මෙම සෙල්ලිපිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩුබුලත්ගම ප්‍රදේශයේ අඹගමුව නැමැති ගමේ අකුරු කෙටූ කන්ද ආශ්‍රිත ව හමු වේ.

## ගමන් මග

නාවලපිටිය-ගිනිගත්හේන ප්‍රධාන බස් මාර්ගයේ ගමන් කොට අඹගමුව වෙත ළඟා වීම පහසු ම මග ලෙස හඳුනා ගත හැකි වේ.

## සෙල්ලිපිය පිහිටුවා ඇති ප්‍රදේශයේ පවතින භූ-ගෝලීය තත්ත්වය

මෙම දිස්ත්‍රික්කය මුහුදු මට්ටමෙන් මීටර 1000 උසකින් සමෝච්ච රේඛාවට ඉහළින් පිහිටයි. වසර පුරා පැතිරුණු මිලි මීටර 200 පමණ මධ්‍ය වර්ෂාපතනයකින් යුත් මෙම ප්‍රදේශයේ උෂ්ණත්වය වශයෙන් සෙල්සියස් අංශක 15ක පමණ වන බවට අගයන් ගණනය කොට තිබේ. පාංශු ව්‍යූහය ගත් කල මෙම දිස්ත්‍රික්කය පුරා රතු කහ පොයිසොලික් පස සහ රෝගෝසෝලිට්

පස හමු වේ. ප්‍රධාන ව ම තේ වගාව හා ඊට අමතරව කෝපි එනසාල් ගම්මිරිස් හා කරාබු නැටි වෙනත් ආර්ථික භෝග වශයෙන් වගා කරනු ලැබේ.

**ශිලා ලේඛනයේ අන්තර්ගතය සැකැවින්**



පෙර ලක්දිව රජවරු ශ්‍රී පාදස්ථානයට කරන ලද පුද පූජාවන් හා එහි ස්ථිර පැවැත්ම උදෙසා කරන ලද වත් පිලිවෙත් මෙන්ම ශ්‍රී පාද පත්මය උදෙසා පැවති භක්ත්‍යාදරය නිසාවෙන් කරන ලද බොහෝමයක් පුද සිරිත් මෙහි දක්වාලයි. පේළි 58කින් සමන්විත මෙම ශිලා ලේඛනය මේ යුගයට අයත් භාෂා ශෛලිය ආදිය හඳුනා ගැනීම උදෙසා වැදගත් වේ. මෙම ශිලා ලේඛනය පළමුවැනි විජයබාහු රජුගේ තිස් අටවෙනි රාජ්‍යය වර්ෂයේ කරවන ලදි. මෙම සෙල්ලිපිය තුළ විජයබාහු රජතුමාගේ වීර වික්‍රමයන් හා දෙමළ බලය මැඩ පවත්වා ලක්දිව එක්සේසත් කල අයුරු මෙන්ම සමනල කන්දේ වන ශ්‍රී පාදස්ථානය වැඳ පුදා ගත් රජු කරන ලද දාන මාන ආදිය පිළිබඳවද මෙහි සඳහන් ය. පුරා විද්‍යාත්මක අගය ගත් කල මධ්‍යකාලීන සිංහල අක්ෂර වලින් කොටා ඇති මෙම සෙල්ලිපිය තුළින් හෙළි වන තොරතුරු අප මහාවංශය සමඟ සංසන්දනයෙන් මේ ලේඛනය පුරා විද්‍යාත්මක සේම ඓතිහාසිකව වැදගත් ය. එමෙන්ම 11 වන සියවසේ සිංහල භාෂා ව්‍යවහාර ක්‍රමවේදය හඳුනා ගැනීම සේම භාෂාවන් ගැන අධ්‍යයනයටත් මෙය ඉතා වැදගත් වේ.

**අභිලේඛණාත්මක ලක්ෂණ හා භාෂා භාවිත විධික්‍රම**

ශිලා ලේඛනයන් පිළිබඳව අධ්‍යයනයේදී එහි වන භාෂා විධික්‍රම පිළිබඳවත් භාෂාව යනාදිය විකාශනය වූ ආකාරයත් එහි ඓතිහාසික ප්‍රවර්ධනය සිදු වූ අයුරු මෙන්ම එම කාල වකවානු පිළිබදව පවතින්නා වු දැනුම බෙහෙවින් වැදගත් ය. අඹගමුව ශිලා ලේඛනය තුල හඳුනා ගත හැකි අක්ෂර මධ්‍ය කාලීන සිංහල අක්ෂර වේ. සිංහල භාෂාව විකාශනය අතින් ප්‍රධාන වශයෙන් කොටස් 4 ක් හඳුනා ගත හැකි ය.

- සිංහල ප්‍රාකෘත යුගය-ක්‍රි පූ 2 සියවස සිට ක්‍රි ව 4 දක්වා
- පුරාතන සිංහල යුගය-ක්‍රි ව 04-ක්‍රි ව 08 දක්වා
- මධ්‍යතන යුගය-ක්‍රි ව 08 සිට ක්‍රි ව 13 තෙක්
- නූතන සිංහල යුගය-ක්‍රි ව 13 සිට නූතනය දක්වා

මෙම ශිලා ලිපිය තුළ හඳුනාගන්නා වූ අක්ෂර සේ මධ්‍යගත සිංහල යුගයේ අක්ෂර හෙවත් මධ්‍යකාලීන සිංහල අක්ෂරයන් දක්වාලිය හැකි ය. ප්‍රමාණවත්ව මට්ටම් නොකල ගලේ අඟල් 4ක් පමණ පරතරයක් ඇත. තීරු සකස් කර ගල් තලාව මත ලියා ඇත. පළමු ගල අඩි 12 අඟල් 3ක් උසරඅඩි 9 අඟල් 7ක් පළලින් යුත් අක්ෂර පේළි 33කි. මෙහි වන දෙවන ගල උස අඩි 9යි අඟල් 3ක් පළල ද ඊට සමාන වේ. මෙම ලක්ෂණ අඩංගු සෙල්ලිපියේ එන පෙළ ගණනින් 58කි.

**සෙල්ලිපියේ සටහන-පෙළ**

1 සිරිවත් අපිරියවත් ලෙව්..
2 ඉකුත් ගුණ මූලින් උතුරත් මූළු ද
3 ඔදිවුහි අන් කැන් කුළ පාම්ලි කළ
4 රිවුහූ අත්වයැ ඔ(කා) ස් (රජ) පරපුරෙන් බටි
5 කැත් (උසබ අභා සලමෙවන්)මහ රජජාභ (ටළු) ඔ
6 කුලෙන් සමද (දෙ වු ගො)ත් රැජිනැ කුසි(නි )පිදැ ඇපාම
7 හයා සිරි වින්ද පිළිවෙළ සෙ රජවැ මිහිවුටුනෙන් පැහැ
8 හයා සිරි වින්දැ පිළිවෙළ සෙ රජවැ මිහිවුටුනෙන් පැහැ
9 රැන් පරපුරට කම්කක් (බ)න් දුවු තුමා (ස (ර)ණ තියර සිත්තර
10 රජ මූන් දුනැ බිසෙස් වු ස(ං)හ තෙදින් හිරු පැළ කෙවීමත් මෙහෙසූ
11 රැ දළ දැකීත් උවින්දු රජ පරිතින් සුරනිදු පබන්ද දෙනෙත් දිනිසුර
12 ත් සත් (සෙතින් සිති )සූරු පැහැස(රි)න් සුරගුර සොම් ගුණෙන් (නි)ස
13 යුරු රුසරින් කැ(න්ද )ඒ කලුණු (ස)රිත් බෝසත් දුනු )සහවුටුණු රජ බරණකිර
14 ණ වු (ජු) රුදුරු (කුලතල) අ(ර)තුමා තු(නු )කප් තරුමින් නොැමිත්තක් රුවින් දුන්
15 තුරෙන් තත් දෙසින් පතලෙ මුළු දිලින්දු සිත් සයුරු පුඹේන් මුළු ලොව පුප
16 තළෙ යස පබන්ද ඇති තුමා සිරිත් (ලක්දිව පහය) නන් නන් දෙසෙහිර
17 පුත් වටහ අසිරි (පඬුරු )සිරිත් සවඟ වීරෙනැ රජ ගෙදරෙහි දසනා
18 වත් පැරකුම් සිරිත් සිරිලකට (සෙසෙ එළි) වූ තුණුරුවනට පුද ඇජරන)
19(ට උවටැන් )යුත්නට ගැමුරු වියත් (හට) සසරි සියතට නුගුරා මිතුරුනට වී
20 යම් සතුරනට (ද ) පැසවූ සත්නට කුළුනුවන් සබවට නුවනා
21 තුමහට එකත් සරු කල සිරිසඟබෝ විජය බාහු රජ පාවහත්
22 සෙත-මා සිය වික්මෙන් දෙමෙළ බළන් මුළු අත්දුරු දුරලා මුළු ලක් දිව් එක්සේසත්
23 තරු රජ වළන්දමින් සාතිස් හවුරුද්දක් සත්ලැගු අටතිස් වනුයෙහි මැ
24 ත් දින දින සන්ද පුරවස් හි පුරසහවත් දවසැ මෙකැපැ බඳු වූ කකුස දන්ද කෝණාග
25 මහ කාස්සපෙ ගෝතමගැ සව් බුදුන් සරණ නඹුරු ආ මුන්දුණනෙන් මු සලුස
26 මනොළ කුළෙහි පිහිටි පදලස් ද විසතුරු සත් රුවන්න් සැදුණ නන්බර
27 ණින් පුද කරයි නොයෙක් පට වැරුලි පියන් ද ද (කො)ඩි නගයි සිවු දැ නන්දීන් ආ
28 ලෙව්කොට තුමා මිණි මුටුනෙන් පදලස් දු සදා වැඩැ සිටැ පැලස්
29 දා පිහිටි සමනොළ කුලෙහි කම්වාම් පුද සිතියම් වැට දලවනුව
30 ට හා මෙහි දවන්දනට සිවු දෙර උස ත් වඩි මහ සඟුන් වහන්සේ
31 ට වටනා පිඬු පසයට හා සෙසු ආදු වන්දනයට රැස් වන ආගන
32 දු බබා ගනයනට දෙන දන්වට (මහාරජ) රට මැ(ගැ )අර(ග)පස්
33 ගවුයෙහි අප නැමින් ගවුයෙකැ සන්හලක් බැගින් කරවා

34 දානෝපකරණ ඇති කොට දන් දෙනු කොට හා පදලස් දා පිහිටි ම එ(යෙන්) පා ..
35( තැ ම එ) වක් කරවා සෙසු (අධමජාතීන් ඉහි)දා වන්දහුකොට හා පෙරමළු
36 යෙහි මඟවුරු බන්දවා දෙමැහැ දෙ දෙරටුවක් කරවා කෙසිමුහු ඇති
37 කොට රක්‍ෂා යොදැමි හැ යුත්තත් ඉහි දා වන්දනු කොට හා පදලසැද
38 ල ඇති කොට (අවටැ) කෙත් කරවනු කොට හා වල්බාරය (අපසත බෙදා)
39 මෙහි බද කෙළගමුව පුවත් අරබි එකක් හිනියගල් කොට
40 වැලි එකක් (සො ර )ගොඩ කොටවැලි එකක් ලියවළ කොටවැලි
41 එකක් බදුලුවනැ කෙටවැලි එකක් උබුහොකොට වැලලේ (පුවක්)
42 කළඟ වෙලැ බඳ මකුළුමුල අඹගමු (වැලි)ගම්(පො)ළ උල
43 පනා ඇතුළු වැ මෙතුවාක් තැත් කුසලාන් බො(පා)
44 කොට මෙයට (තුසිනාළා )රජකොල් කම්යන් නොමද නා
45 කොට දෙරුවනැ දෙකම්තැන් නොවදනා ගොට මගිවි පියගි
46 විකුලි මෙලාය විඩේ විඩේ දුන් පඩුරු නොගන්නා කොට
47 ගැල් ගොන් (කිරි ගෙ)රි අඳිනා වැරියන් නොගන්නා කොට
48 පස්මා දොසින් ඇතුළත් වරදක් කොට ගම් වන්න(වු)න්
49 ඇන ගම් හිමි පත්වා දුෂ්හුත් ගම් වැඳ නොගන්නා
50 කොට අටතිස්(පි)න්න (මතු) හවුරුදු පටන් කොට එකතැන
51 සමුයෙන් පා වැන්දැ ආ මෙකාප්පර වැදැරුම් කාළුන්න
52 රු බිම් අ(යන්නාත) වන්වරු හක්කගම් කිතු කොළො
53 ඔගලු දොලු මහ නිලංගම් කි(ත්)ළි දෙටුරමු
54 න් කඹු (අ) ගා රක්ක දණන් මරු කුඹසලා කිතු ඇ
55 කුළු වැ මෙතුවාක් සම්දරුවන් විසින් මෙ අත්තාණි
56 කණු පෙරුහැර දෙනු ලදී......(යෙ බද)
57 .......(නවාම් කෑ මිනාවන්).. .(යමු යම් ගො).....
58 .....වහන්සේ කරවන(ලදී)

**පෙළ හා සබැඳි ඓතිහාසික විස්තරය**

ඉහත දක්වන ලද පෙළ හා සබැඳි ව අඹගමුව ශිලා ලේඛනය ගත් කල මෙහි එන විස්තරය තුළ ගැබ් වන ඓතිහාසික විස්තරය ඉතා වැදගත් වේ. මහා විජයබාහු රජු ශ්‍රී පාදස්ථානය සඳහා කරවූ අප්‍රමාන සත්ක්‍රියා සහ සංවිධාන සිහිපත් කරනු වස් මේ මහා සෙල්ලිපිය කරවූ නමුත් වෙනත් වැදගත් තොරතුරු රැසක් ම මෙයින් ලෝකයාට අනාවරණය කරන්නට සිතූ බව උගතුන්ට වැටහෙයි.

රජතුමාගේ හා බිසවගේ කුලවංශ රාජ සිරිත් විධි නියම පරිදි තෙමේත් පළමුවෙන් ම ආදිපාද මහාදිපාද තනතුරු දැරූ පසු මහරජ බවට පැමිණි අයුරුත් ලිපියේ මුල් කොටසින් පැවසේ. අනතුරු ව රජතුමන්ගේ උසස් තත්ත්වය මෙන් ම ප්‍රශංසනාත්මක ගති ගුණත් සතුරු ද්‍රවිඩ සේනා බලය නසමින් සියලු ලක එක්සේසත් කල පරිදි දැක්වූහ.

එයින් මතු විජයබා නිරිඳුගේ රාජ්‍යොදයෙන් 38 වන වසර මැදින් මස පුන් පොහෝ දින සමන්කුළු පව්වෙහි වූ සිරිපා සලකුණ කරා පැමිණි නා නා විධ පූජා විධි පවත්වා එහි නව කම්ද කරවා සිවු දිගින් වඩින්නා වූ මහා සංඝයා වහන්සේලාට මෙන්ම දුගී ජනයාටත් දන් වැඩ සලස්වා රජරටින් සමන්කුළු යන මාර්ගයේ ගවුවකට 1ක් බැගින් පස් ගව් පමණ තන්හි සිය නමින් දන්හල් කරවී ය. සිරිපා මලුව පිහිටා තිබෙන මලුවෙන් පහත දෙවන මළුවක්ද කරවා පහත් කුලීනයන්ට එහි සිට සිරිපා වඳින්නට ඉඩ සැලසූ අතර පළමුවන මළුවේ පවුරු බැමි හා දෙදිගින් යතුරු සහිත දොරටු දෙකක් කරවූ බවත් එහි රැකවළුන් යෙදෙව්වේ ය. ඉන් පසුව කෙසෙල්ගමු මාර්ගයෙන් ගමනාගමනයේ යෙදෙන වන්දනාකරුවන්ට සංග්‍රහ කරවනු පිණිස කෙත්වතු ගම් සකස් කරවූ බැව් සදහන් ය.

සෙල්ලිපියේ එන පරිදි වරහැත්තගම, කොළඹගම, ගලදොව්, මහකිලිංගම, කිත්ලිදෙටු, රඹුක්කඹුගම, අගාරක්කමණන්වර, කුඹසලානිතු යන මෙම නිළධාරීන් විසින් මේ රාජාඥා ලේඛනය කරවා උත්සව සහිතව විවෘත කළහ. සෙල්ලිපිය අවසන මැනවින් හඳුනාගත නො හැකි අකුරු  පේලි තුනක් වේ. එහි "බගිකිරිය"නම් තැනක පියගැටපේලි කරවූ බව කියා මුළු ලක ගම් නියම් ගම්හි කළමනා ද "විජයබා වහන්සේ කරවන බවයි" යනුවෙන් ලිපිය අවසන් කරන ලද්දේ වෙයි.

මෙසේ ශ්‍රී පාද  වන්දනාකරුවන්ට සංග්‍රහ කරනු පිණිස  විජයබා රජු විසින් සෙල්ලිපිවල සදහන් කරවා පවරා තිබුණු උලපනේ සිට සමන්කුළු පව්ව දක්වා ඇති ගම්වල වැසියෝ කල් යාමෙන් ඒ නියෝග ඉටු නො කළ බවත් පෙර සේ ම නියමිත බු.ව. 1742වන අවුරුද්දෙහි සිරිලක රජ පැමිණි නිශ්ශංකමල්ල නම් මහීකාලකයාට එකී යම් යලිත්  පෙර සේම නියමිත කාර්යය සඳහා පවරා "බගවාලෙන" ආදී තැන්හී සෙල්ලිපි කරවා ස්ථිරත්වය නඟා සිටුවා තබන්නට සිදුවිය.

බුද්ධ වරෂ වලින් 1798 වන කල ලක් රජ පැමිණි ශ්‍රීමත් කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමාත් ස්වකීය රාජධානිය වූ දඹදෙණිය නගරයෙන් සපිරිවරින් නික්ම ගඟසිරිපුර මඟින් සමනොළට ගොස් සිරිපා සලකුණු නැමැද පින් රැස් කරගෙන සමන්කුළු පව්ව අවට විවිධ රත්නයන්ගෙන් හා ස්ත්‍රී පුරුෂ සමූහයාගෙන් සමන්විත වූ ඒ ජනපදය ශ්‍රී පාදස්ථානයට මහත් බැතියෙන් පුද කර සිටි බැව් සඳහන් වේ.

ඉන් අනතුරුව සෙල්ලිපිය කරවා විවෘත කළ පිරිසගේ නම් ඊට අනතුරු ව පවසති. රජතුමන්ගේ ආරක්ෂකයන් වශයෙන් කැටුව ගොස් සිරිපා වැද කටයුතු කියා නිමවා ආපසු හැරී මෙයිකාප්පවරුන් වූ කළුන්නරුබිම් අයස්ථාන රුවන් අබරණින් සිරිපා සලකුණ පිදී. මේ අද අපමණ පුඳ පැවැත්වූ නරනිඳු එයින් තම රාජධානියට ආපස අවුත් සමන්කුළට යා යුතු මාර්ගයෙහි පවත්නා දුගී තත්ත්වය සලකා ඒ සකස්  කරන්නට සිතීය. එය සෙල්ලිපියෙහි සරල අදහසින් පහත පරිදි වේ. ඉක්බිති තෙරුවන් කෙරෙහි උදක් බැති පෙම් ඇති බුද්ධත්වය පතා බොහෝ පින්කිරියෙහි යෙදුනු ස්වකීය හිතෛෂී දුනුකේවතු වංශයෙහි උපන් ප්‍රති රාජදේව නම් ඇමතිවරයා බණවා එපවත් කියා අනිෂ්ට වූ වසවත් මරහු විසින් මවන ලද්දක් වැනි පංච දුර්ග

ජල දූර්ග වන දූර්ග ගිරි දූර්ග ආදීයෙන් ගහන වූ සමන්කුළු ගමන් මග අටලොස්දේශ වාසින්ගේ ගමන් මග එහසු ම පිණිස මොනවට සකස් කරවයි අණ කළේ ය.

ශ්‍රී පාදස්ථානය හා ආශ්‍රිත ගම්වර පූජා කිරීම හා සම්බන්ධ ව ලිය වී ඇති ලේඛන මූලාශ්‍රයන් පිළිබඳ ව විමසීමේ දී අඹගමුව ශිලාලිපිය වැදගත් වන පරාසයන් කිහිප ආකාරයකින් අපට හඳුනාගත හැකි ය. ශ්‍රී පාද වන්දනාවේ ගිය වන්දනාකරුවන්ට අඹගමුව නවාතැන්පලක් වූ බැව් 11 වන සියවස සිට කෙහෙල්ගමුව පාරෙන් ශ්‍රී පාද වන්දනාවේ ගිය දඹදෙණියේ පතිරාජ ඇමති අඹගමුව පසු කර ගියා යැයි සඳහන් වීම හොඳම සාධකයකි. මහා විජයබාහු රජු මෙම අඹගමුව ගම්මානයෙන් ලද ආදායම කරුණු සතරක් සපුරනු වස් යොදවා තිබූ බව සඳහත් කරයි.

- ශ්‍රී පාදස්ථානයෙහි නව ක්‍රමාන්ත ඉදි කිරීම.
- ශ්‍රී පාද වන්දනාවට වඩින භික්ෂූන් ට දාන පහසුකම් සැලැස්වීම
- ශ්‍රී පාද වන්දනාවට එන අසරණයන්ට සංග්‍රහ කිරීම
- ශ්‍රී පාද මාර්ගයෙහි කරන ලද දන්සැල් පැවැත්වීම

මේ යනාදී කරුණු රාශියක් පාදක කර ගනිමින් අපට ශ්‍රී පාදස්ථානය හා සබැඳි උතුම් වු ශාසනික මෙහෙවරක අරුමය මොනවට පැහැදිලි කර ගත හැකි ය.

**නිගමනය**

ශ්‍රී පාදස්ථානය හා එහි වන්දනාමාන කටයුතු සිදු කළයුතු ආකාරයත්, පුරාණ රජවරුන් ශ්‍රී පාදස්ථානයට කළා වූ පුදපූජාදිය ගැනත් මනා වූ දැනීමක් ලැබ ගන්නට අඹගමුව ශිලා ලිපිය පාදක කර ගත හැකි වේ. මෙම ලේඛනයෙන් සනාථ වන කරුණු අනුව ඒ සමයන්හී අක්ෂර භාවිතය, ආර්ථික තත්ත්වය, ශාසනික සේවය ආදිය පිළිබඳ කරුණු අවබෝධයක් ලබා ගැනීම උදෙසා ද මෙම සෙල්ලිපිය වැදගත් මූලාශ්‍රයකි. බොහෝ දෙනාගේ අවධානයෙන් තොර මෙබඳු ස්ථාන වෙත යොමු කරන අවධානය තව දුරටත් ස්ථාවර වී නම් මෙම ස්ථානය සතු පුරාවිද්‍යාත්මක අගය තවත් තීව්‍ර වනු ඇත.

**ආශ්‍රේය මූලාශ්‍ර හා ලිපි නාමාවලිය**

ධම්මානන්ද හිමි මකුරුප්පේ, ***විමර්ශනාත්මක සිංහල ශිලාලිපි මාලා***, 2001, සමයවර්ධන පොත්හල පෞද්ගලික සමාගම, 61, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි මාවත, මාළිගාකන්ද පාර, කොළඹ 10

විජේතුංග සිරිසමන්, ***ශ්‍රී ලංකාවේ ශිලාලිපි සන්නිවේදනය***, 2007, ආරිය ප්‍රකාශක යෝ බෞද්ධ විද්‍යාලය මාවත, වරකාපොල

විජේසිංහ ටී.කේ., ***පෞරාණික ස්ථාන සහ ස්මාරක***, නුවරඑළිය දිස්ත්‍රික්කය, 2005, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පානළුව, පාදුක්ක